(නවවැනි පාර්ලිමේන්තුව - දෙවැනි සභාවාරය)

**අංක 41.]**

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2022 ජූනි 22 බදාදා පූ.භා. 10.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

1316/2022

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මධ්‍යම අධිවේගී මාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ වර්තමාන ප්‍රගතිය;

(ii) එම ව්‍යාපෘතිය අවසන් කිරීම සඳහා යෝජිතව තිබූ දිනය;

(iii) එම ව්‍යාපෘතිය අවසන් කිරීමට අපේක්ෂිත දිනය;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට ඉහත ව්‍යාපෘතිය සඳහා වැය කර ඇති මුදල කොපමණද;

(ii) එම ව්‍යාපෘතිය අවසන් කිරීම සඳහා තවදුරටත් වැය කළ යුතු මුදල කොපමණද;

(iii) ඉහත ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සිදු කරනු ලබන සමාගම කවරේද;

(iv) පසුගිය රජය සමයේදී එම ව්‍යාපෘතියට අදාළව අක්‍රමිකතා සිදු වී තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1476/2022

ගරු රෝහණ බංඩාර මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පවතින වැව් සංඛ්‍යාව කොපමණද;

(ii) එම වැව්වල නම් කවරේද;

(iii) එම වැව් අතරින් වර්තමාන රජයේ වැව් සංවර්ධනය කිරීමේ වැඩසටහන සඳහා ඇතුළත් කර ඇති වැව් සංඛ්‍යාව කොපමණද;

(iv) එම වැව්වල නම් කවරේද;

(v) ඉහත වැඩසටහන සඳහා ඇතුළත් කර නොමැති වැව් ද කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1735/2022

ගරු කිංස් නෙල්සන් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ 2021/2022 වර්ෂයේ මහ කන්නයේදී වගා කරන ලද කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම කන්නයේ අපේක්ෂිත වී අස්වැන්න කොපමණද;

(iii) එම වී අස්වැන්න මිලදී ගැනීම සම්බන්ධයෙන් අමාත්‍යාංශය මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1946/2022

ගරු ලලිත් එල්ලාවල මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජනතා විමුක්ති පෙරමුණේ හිටපු නායක රෝහණ විජේවීර මහතාව 1989.11.12 වන දින එවකට පැවති රජය විසින් අත්අඩංගුවට ගෙන ඒ බව මාධ්‍ය මඟින් ප්‍රකාශයට පත් කරන ලද බවත්;

(ii) 1989.11.13 වන දින ඔහු මිය ගොස් ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) රෝහණ විජේවීර මහතාගේ මරණය ස්වභාවික මරණයක්ද;

(ii) නොඑසේ නම්, ඝාතනයක්ද;

(iii) එම මරණය ඝාතනයක් නම්, ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ අධිකරණයක් මඟින් ලබා දෙන ලද නඩු තීන්දුවක් තිබේද;

(iv) මෙම මරණය සම්බන්ධයෙන් ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයකු හෝ නායකයකු හෝ විසින් නීති මඟින් කටයුතු කිරීමට පියවර ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1947/2022

ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගල් කැඩීම, මහනුවර දිස්ත්‍රික්කයේ මහා පරිමාණ කර්මාන්තයක් ලෙස සිදු කරනු ලබන බවත්;

(ii) කුණ්ඩසාලය ප්‍රදේශයේ දිගන, හීපිටිය, අහස්පොකුණ, හා මල්පාන යන ප්‍රදේශවලත් යටිනුවර ප්‍රදේශයේ අලගල්ලේ සහ උඩුනුවර ප්‍රදේශයේ එළුගොඩ හා හඳපාන යන ප්‍රදේශවල එම ගල් කැඩීම් හේතුවෙන් සුවිශාල පාරිසරික හානියක් වන බව අදාළ ආයතනවලට පැමිණිලි කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වනවිට මහනුවර දිස්ත්‍රික්කයේ ගල් කැඩීම සඳහා නිකුත් කර ඇති බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(ii) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයිති ඉඩම්වල එම ගල් කැඩීම සිදු කරන්නේද;

(iii) එසේ නම්, එම ඉඩම්වල ගල් කැඩීම සඳහා ලබා දී ඇති බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ගල් කැඩීම හේතුවෙන් සිදු වන දූවිලි විසිරීම, ගල් ඉවතට විසිවීම, මාර්ග විනාශ වීම ආදී මහජන පීඩා සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග;

(ii) ගල් කැඩීම හේතුවෙන් යටිනුවර, නාවලපිටිය, උඩුනුවර, කුණ්ඩසාලය යන ප්‍රදේශවල ජලමූලාශ්‍ර විනාශ වීම සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග;

කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

1959/2022

ගරු ගාමිණී වලේබොඩ මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා වැවිලි කර්මාන්ත විෂයභාර අමාත්‍යවරයා ලෙස කටයුතු කරන ලද එක් එක් අමාත්‍යවරයාගේ නම හා ධුර කාලය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉහත එක් එක් අමාත්‍යවරයා විසින් සිය ධුර කාලය තුළ පත් කරන ලද උපදේශකවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම එක් එක් උපදේශකවරයාගේ නම, වයස, අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් වෙන් වශයෙන් කවරේද;

(iv) එක් එක් උපදේශකවරයා සඳහා ගෙවන ලද මාසික වැටුප, දීමනා සහ ලබා දී තිබූ වෙනත් පහසුකම් කවරේද;

(v) එම එක් එක් උපදේශකවරයා වෙත පවරා දී තිබූ වගකීම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම එක් එක් උපදේශකවරයා නිරත වී ඇති විදේශ සංචාර, එම විදේශ සංචාරවල නිරත වීම සඳහා හේතු වූ කරුණු, ඒ සඳහා දරන ලද වියදම් හා එමඟින් අමාත්‍යාංශයට අත් වූ ප්‍රතිලාභ වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

1993/2022

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2018 දක්වා වූ කාලය තුළ ශ්‍රී ලංකාවේ ජාතික පාසල්වල අනධ්‍යයන කාර්ය මණ්ඩල සඳහා සේවකයන් බඳවාගත් බව එතුමා දන්නෙහිද?

(ආ) එක් එක් ජාතික පාසල සඳහා එසේ බඳවාගන්නා ලද සේවකයන් සංඛ්‍යාව එක් එක් තනතුරු නාමය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

2003/2022

ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බඩල්කුඹුර සහ බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල වැව් හතක් ආශ්‍රිතව 2003 වර්ෂයේදී ආරම්භ කරන ලද "මුතුකෙලියාව පෝෂිත ඇළ" ව්‍යාපෘතියේ වැඩ කටයුතු 2019 වර්ෂයේදී අවසන් කරන ලද බව දන්නේද;

(ii) ව්‍යාපෘතිය මඟින් සෘජුව ජලය සපයනු ලබන වගාබිම් ප්‍රමාණය සහ ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත ව්‍යාපෘතියෙන් ජලය සැපයීමට නියමිත කෝන්ගහ වැව, සේරු ගස් ආර, නාගස් ආර, කරවිල කනත්ත, නිකමඩ වැව, ඉහුරු ආර, තම්මැන්නාර යන වැව් අතරින් මේ වනවිට ජලය සපයා තිබෙන වැව්වල නම්;

(ii) එම ව්‍යාපෘතියෙන් ජලය සැපයීමට නියමිත මුතුකෙලියාව, කටුගහගල්ගේ, දික්යාය, පෙට්ටගම්වෙල, මැදගම, වගුරුවෙල, කෝන් කැටිය යන ග්‍රාම නිලධාරී වසම් අතරින් මේ වනවිට ජලය සපයා ඇති ග්‍රාම නිලධාරී වසම්වල නම්;

(iii) මේ වනවිට ජලය සපයා නොමැති ග්‍රාම නිලධාරී වසම්වලට ජලය සැපයීමට පවතින බාධා;

(iv) එම බාධා ඉවත් කිරීමට ගනු ලබන පියවර හා දින වකවානු;

කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1),— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල සහ 2022 ජනවාරි 19 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 10.00 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.30 සිට අ.භා. 4.30 දක්වා ද විය යුතු ය. පූ.භා. 11.00ට ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 4.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2),— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, 2022 ජූලි 04 සඳුදා පාර්ලිමේන්තුව රැස්වන දිනයක් විය යුතු ය.

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 3),— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, 2022 ජූලි 04 සඳුදා රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 10.00 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.30 සිට අ.භා. 3.30 දක්වා ද විය යුතු ය. අ.භා. 3.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

4.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ වැඩකටයුතු,— 2022 ජූලි 04 සඳුදා පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයේ වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න පිළිබඳ වැඩකටයුතු පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 35හි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

5.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 4),— අද දින විසිර යැමේදී මෙම පාර්ලිමේන්තුව 2022 ජූලි 04 සඳුදා පූ.භා. 10.00 වන තෙක් කල් තැබිය යුතු ය.

---

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා,— විදේශ විනිමය පනත යටතේ නියෝග,— 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වගන්තිය සමඟ කියවිය යුතු 29 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 මාර්තු 28 දිනැති අංක 2273/06 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.06.07 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා,— අත්‍යවශ්‍ය මහජන සේවා පනත යටතේ යෝජනා සම්මතය,— 1979 අංක 61 දරන අත්‍යාවශ්‍ය මහජන සේවා පනතේ 2 වගන්තිය ප්‍රකාරව ජනාධිපතිවරයා වෙත පැවරී ඇති බලතල අනුව, 2022 ජූනි 08 දිනැති අංක 2283/33 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ හා එහි උපලේඛනයෙහි පළ කරනු ලැබ, 2022.06.10 දින ඉදිරිපත් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය.

*3.

සත්ව සුබසාධන පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

4.

ජාත්‍යන්තර සිංහ සමාජ දිස්ත්‍රික්ක 306 ඒ - ජාතික සංවර්ධන පදනම් භාරය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

5.

වත්කම් සහ වගකීම් ප්‍රකාශ කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

6.

දුම්කොළ බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

7.

වයිට් රෝස් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

8.

රොෂාන් රණසිංහ ජනසහන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

9.

මානව හිමිකම් සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

10.

සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

11.

සාමය, අධ්‍යාපනය, බලගැන්වීම සහ සංවර්ධනය උදෙසා වූ ක්‍රීඩා ආයතනය (SPEED) (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

12.

ශ්‍රී ලංකා වරලත් ප්‍රවාහන ආයතනය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

13.

හදිසි මහජන සෞඛ්‍ය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***